## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# මුද්දර ගාස්තු

## මුද්දර ගාස්තු සමථයකට පත්කිරීමේ බලයලත් තැනැත්තන් විසින් මුද්දර ගාස්තු ගෙවීම

## සමථයකට පත් කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සහ මුද්දර ගාස්තු ප්‍රේෂණය කිරීම

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය යටතේ;

(අ) රක්ෂණ ඔප්පු නිකුත් කරනු ලබන යම් තැනැත්තෙකු;

(ආ) පුද්ගලයන් සියයකට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති, සේවකයන් සඳහා කරන ලද ගෙවීම් සඳහා ලදුපත් භාරගනු ලබන යම් සේවා යෝජකයෙකු;

(ඇ) බලපත්‍ර නිකුත්කරන යම් අධිකාරියක්;

(ඈ) ණය කාඩ්පත් පහසුකම් සලසන යම් සේවා සපයන්නෙකු;

(ඉ) අවස්ථානුකූලව එසේ කිරීමට බැඳෙන යම් වෙනත් තැනැත්තෙකු;

පිළිවෙලින් රක්ෂණ ඔප්පු, ලදුපත්, හිමිකම් බලපත්‍ර හෝ යම් වෙනත් සාධන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ගාස්තු මුදල සමථයකට පත්කිරීම සහ සෑම වසරකම මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන අදාළ කාර්තු අවසන් වී දින පහළොවක් ඇතුළත එම මුදල කාර්තුමය වශයෙන් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීම කළ යුතුය.

**(ඉහත (අ) සිට (ඉ) දක්වා සඳහන් කාර්යයන් අතුරින් එක් කාර්යයක් හෝ ඉටු කරන තැනැත්තකු මෙතෙක් ලියාපදිංචි වී නැතිනම් ලියාපදිංචි වී මුද්දර ගාස්තු ගෙවිය යුතුය.)**

**ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 4153842 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ මුද්දර ගාස්තු ගිණුමට, සමථයකට පත්කරන ලද මුද්දර ගාස්තු ගෙවිය යුතු අතර, ප්‍රේෂණ පත්‍රිකාවේ බදු ගෙවන්නාගේ පිටපතේ ඡායා පිටපතක්, ප්‍රකාශනයේ දෙපාර්තමේන්තු පිටපත් (1 හා 2) සමග අමුණා මුද්දර බදු අංශයට එවිය යුතුය. එකී ප්‍රකාශනයේ බදු ගෙවන්නාගේ පිටපත තම මුද්දර බදු ලිපි ගොනුවේ තබාගත යුතුය. (කිසිදු විටක ගෙවීම් සම්බන්ධයෙන් චෙක්පත් මුද්දර ගාස්තු අංශය වෙත සෘජුවම නොඑවන ලෙස කරුණාවෙන් දන්වමි.)**

අදාලවන අනුප්‍රමාණයන් දක්වන සටහන සහ ප්‍රකාශනය පිරවීම හා ඉදිරිපත් කිරීම සඳහා වන උපදෙස් මාලාව, සහ රාජ්‍ය ආයතන ප්‍රධානීන් අමතන ලද චක්‍රලේඛය - www.ird.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා **දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් අඩවිය - **www.ird.gov.lk**

**කරුණාකර කලට වේලාවට ගෙවීම් කරන්න.**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**